**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (II) සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I)</u>**

2017.04.12 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද උක්ත කාර්යක්ෂමතා කඩඉම් විභාග නිවේදනයේ 12.8.3 (III) ඡේදය, 14.2 ඡේදය සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළවූ නිවේදනයේ 13 ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

i. විභාග නිවේදනයේ 12.8.3 (III) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතුය.

III. වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (විෂය අංකය 23) (ලකුණු 100)
වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකා වලට අදාළව පිළිතුරු සැපයීමට සිදුවේ.)
සටහන - මෙම විෂය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු වේ.

ii. විභාග නිවේදනයේ 14.2 ඡේදය මගින් දැක්වෙන වගුව වෙනුවට පහත වගුව ආදේශ විය යුතුය.

| | අංක 1419/3 හා 2005.11.14 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 01. | නීතිය(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | නීතිය(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 02. | පරිපාලනය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | පරිපාලනය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 03. | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 04. | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 05. | ඉංග්‍රීසි(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන භාෂා ප්‍රවීණතාව (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 06. | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 07. | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 08. | කළමනාකරණය සහ සංවිධානය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය (දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

iii. ඉංග්‍රීසි නිවේදනයේ 13 ඡේදය යටතේ දැක්වෙන විභාග කාල සටහනෙහි අනු අංක 9 පහත පරිදි සංශෝධනය විය යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 09 | 2nd Efficiency Bar Examination for Officers of Sri Lanka Planning Service | Techniques of Development Planning | 21 | 2017.07.16 | 12.30 p.m - 3.30 p.m |
| | | Basic Macro Economics | 22 | 2017.07.22 | 9.00 a.m - 12.00 p.m |
| | | Current International Economic Crises and their impact on Sri Lankan Economy | 23 | 2017.07.22 | 12.30 p.m - 3.30 p.m |

සටහන :

(අ) මෙම සංශෝධන හේතුවෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - **2017 (I)** සඳහා අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය **2017.05.29** දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

(ආ) <u>විභාගයට දෙවන වර පෙනී සිටින නිලධාරීන්</u> විභාග ගාස්තු ගෙවීම සම්බන්ධව පහත උපදෙස් අනුගමනය කළ යුතු වේ.

i. විභාග ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් විභාග නිවේදනයේ 6 වන ඡේදයේ සඳහන් විධිවිධාන තවදුරටත් බලපැවැත්වෙන අතර ඒ අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට අයදුම් කරන ලද අයදුම්කරුවකු මෙම සංශෝධනය හේතුවෙන් තවත් විෂයයකට අයදුම් කරන්නේ නම් අමතර රු.500/- ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ.

ii. යම් හෙයකින් මීට පෙර විභාග නිවේදනයට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයයන් කිහිපයකට අයදුම් කරන ලද අයදුම්කරුවකු මේ වන විටත් රු. 1000/-ක විභාග ගාස්තුවක් ගෙවා ඇති බැවින් මෙම සංශෝධනය හේතුවෙන් මෙම විභාගයේ තවත් විෂයයකට හෝ විෂයයන් කිහිපයකට අයදුම් කරන්නේ නම් අමතර විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

(ඇ) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට මේ වනවිටත් (2017 (I)) අයදුම් කර ඇති අයදුම්කරුවකු දෙවන වරට ද විභාග ප්‍රවේශ පත්‍රයක් බාගත කළ යුතු වේ. විභාගයට ඉදිරිපත් වීමේ දී වලංගු වනුයේ එම දෙවන වරට බාගත කරගත් ප්‍රවේශ පත්‍රය වේ.

(ඈ) මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් මතුවුවහොත් ඒ පිළිබඳව විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236 දුරකථන අංකය 2017.05.29 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා විවෘතව ඇත.

(ඉ) මෙම සංශෝධන හේතුවෙන් විභාගය පවත්වන දිනයන්හි වෙනසක් සිදු නොවේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 මැයි මස 04 වෙනි දින
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.